# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 1924/2 - 2015 ජූලි මස 20 වැනි සඳුදා - 2015.07.20**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*යොමු අංකය* : බිය/3/1/1/262/1ගොනුව.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව් ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබා ගැනීමට බලාපොරොත්තු වන ඉඩම්වල විස්තර:

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, බියගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අධිකාරි පත්තුව සුළු කොට්ඨාසයේ, අංක 269 ඉහල බියන්විල උතුර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ ඉහල බියන්විල ගමේ පිහිටි මැනුම් අධිකාරි විසින් පිළියෙල කරන ලද මූලික පිඹුරේ අංක ගම් 3959 ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.1256ක් පමණ වූ පහත සඳහන් ඉඩම් කැබැල්ල.

**1. කැබලි අංක 1**

ඉඩමේ නම: ජම්බුගහ කුඹුර ඔිවිට; විස්තරය: කුඹුර; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: ඩී. අයි. එන්. එම්. නෙගලි, අංක 8, ඇල්ප්‍රඩ් පෙදෙස, කොළඹ 03; ප්‍රමාණය: හෙක්. 0.0121.

**2. කැබලි අංක 2**

ඉඩමේ නම: ජම්බුගහ කුඹුර ඔිවිට; විස්තරය: ගෙවත්ත, ස්ථිර ගොඩනැගිල්ලක් ඇත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: එස්. ඩී. ජයරත්න, අංක 174/3 බී, ඉහළ බියන්විල, කඩවත; ප්‍රමාණය: හෙක්. 0.0142.

**3. කැබලි අංක 3**

ඉඩමේ නම: ජම්බුගහ කුඹුර ඔිවිට; විස්තරය: ගෙවත්ත, ස්ථිර ගොඩනැගිල්ලක් ඇත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: ලොරේන් මරීනා පෙරේරා, අංක 174/3 ඒ, ශ්‍රමදාන මාවත, කඩවත; ප්‍රමාණය: හෙක්. 0.0322.

**4. කැබලි අංක 4**

ඉඩමේ නම: ජම්බුගහ කුඹුර ඔිවිට; විස්තරය: ගෙවත්ත, ස්ථිර ගොඩනැගිල්ලක්, වැසිකිලියක් සහ සිමෙන්තියෙන් බඳින ලද ළිඳක් ඇත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: විජේවෙල වීරගෙ එඩ්මන් නිලන්ත කුමාර, අංක 174/2, ඉහළ බියන්විල, කඩවත; ප්‍රමාණය: හෙක්. 0.0169.

**5. කැබලි අංක 5**

ඉඩමේ නම: ජම්බුගහ කුඹුර ඔිවිට; විස්තරය: ගෙවත්ත, ස්ථිර ගොඩනැගිල්ලක් ඇත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: නවගමුව දේවගේ ඩීමන් අතුල ප්‍රනාන්දු, අංක 174/1, ඉහළ බියන්විල, කඩවත; ප්‍රමාණය: හෙක්. 0.0153.

**6. කැබලි අංක 6**

ඉඩමේ නම: ජම්බුගහ කුඹුර ඔිවිට; විස්තරය: ගෙවත්ත, ස්ථිර ගොඩනැගිල්ලක් සහ වැසිකිලියකින් කොටසක් ඇත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: එන්. ඩී. එල්. චන්ද්‍රා කුමාර, අංක 174/1, ශ්‍රමදාන මාවත, ඉහළ බියන්විල, කඩවත; ප්‍රමාණය: හෙක්. 0.0126.

**7. කැබලි අංක 7**

ඉඩමේ නම: ජම්බුගහ කුඹුර ඔිවිට; විස්තරය: ගෙවත්ත, තාවකාලික ගොඩනැගිල්ලක් ඇත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: ඩබ්ලිව්. සී. කේ. ජේ. ප්‍රනාන්දු, අංක 155, දුම්රිය මාවත, මහරගම; ප්‍රමාණය: හෙක්. 0.0223.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 2015 අගෝස්තු මස 06 වැනි දින පෙ.ව. 10.00 ට මහරගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

---

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

තව ද 2015 අගෝස්තු මස 03 වැනි දිනට මත්තෙන් එම ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත්, මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතු යි.

ඩබ්. එච්. වී. පුෂ්පමාලා,
ප්‍රාදේශීය ලේකම්,
බියගම.

2015 ජුලි මස 16 වැනි දින,
බියගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

08-14

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.